ගංවතුර හා නායයෑම් කෙරෙහි අවිධිමත් ඉඩම් පරිහරණයේ බලපෑම: ගාල්ල දිස්ත්‍රික්කයේ යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්

කේ. ජී. සිරන්ත[1] පින්නවල සංඝසුමන හිමි[2]
[1]ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව; [2]භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
sianthakgamage@yahoo.com

ස්වභාවික ආපදා වර්ධනය වීම කෙරෙහි බලපාන සාධක කාලීන හා අවකාශීය වශයෙන් විවිධත්වයක් ගනී. කිසියම් ව්‍යසනයකින් සිදුවිය හැකි බලපෑම අවම කිරීම ආපදා කළමණාකරණයේ එක් අවස්ථාවක් වන බැවින්, එබඳු විපත් වර්ධනය වීම කෙරෙහි බලපාන සාධක විශ්ලේෂණය කිරීම කෙරෙහි වර්තමානයේ සුවිශේෂ අවධානයක් යොමුව තිබේ. ශ්‍රී ලංකාවේ ඍතුමය වශයෙන් සිදු වන ස්වභාවික අපදා අතර වැඩිම බලපෑමක් සිදු කරන්නේ ගංවතුර හා නායයෑම් ය. කාලීන හා ප්‍රාදේශිය වශයෙන් එහි තීව්‍රතාවත්, සංඛ්‍යාතයත්, විනාශකාරී බවත් වෙනස් වන බැවින් අපදා කළමණාකරණයේ දී ඒ පිළිබඳව වඩාත් අවධානය යොමු කළ යුතුය. පොදුවේ සලකන කල ශ්‍රී ලංකාවේ ගංවතුර හා නායයෑම් කෙරෙහි බලපාන භෞතික සාධක පිළිබඳව පුළුල් අවධානයක් යොමු කර ඇතත් විශේෂිත මානව සාධක පිළිබඳව සිදු කර ඇති අධ්‍යයනයන් සීමා සහිතය. ජන සංඛ්‍යාවේ සීඝ්‍ර වර්ධනයත් සමග ස්වභාවික පරිසරය කෙරහි මානව ක්‍රියාකාරකම්වල බලපෑම ප්‍රබල වීම හේතුවෙන් විවිධ පරිමාණයේ ගැටළු උද්ගත වෙමින් පවති. ඒ අතුරින් ගංවතුර හා නායයාම් විපත් වර්ධනය විම, ශ්‍රි ලංකාව මුහුණ පාමින් සිටින ප්‍රබල අභියෝගයක් වශයෙන් හැඳින්විය හැකිය. මේ සඳහා ඍජු ලෙසම බලපානු ඇතැයි සැලකෙන මානව සාධක අතර 'අවිධිමත් ඉඩම් පරිහරණය' තීරණාත්මක සාධකයක් වන්නේද යන පර්යේෂණ ගැටළුව පදනම් කරගෙන මෙම අධ්‍යයනය සිදු කර තිබේ. පවත්නා භූමි තත්වයන්ට හා ගුණාංගවලට අනුකුල වන පරිදි ප්‍රශස්ත මට්ටමේ ඉඩම් පරිහරණයක් පවත්වා ගෙන යාමේ දී මතුවන ගැටළු හඳුනා ගැනීමත්, අවිධිමත් ලෙස සිදු කරන ඉඩම් පරිහරණය ගංවතුර හා නායයාම් වර්ධනය විම කෙරෙහි හේතු වී තිබේද යන්න පරීක්ෂා කිරිමත්, මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වේ. එම අරමුණු සපුරා ගනු වස් ගාල්ල දිස්ත්‍රික්කයේ යක්කලමුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය තුළ ගංවතුර හා නායයෑම් ආපදාවලට ලක්වන ග්‍රාම නිළධාරි වසම් අතුරෙන් තෝරාගත් නියදියක් ආශ්‍රයෙන් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. මූලික වශයෙන් දත්ත විශ්ලේෂණයේ දී සංඛ්‍යාන විiාත්මක හා සිතියම් විiාත්මක ක්‍රම ශිල්ප භාවිතයට ගන්නා ලද අතර ප්‍රතිඵල සාකච්ජා කිරීමේ දී ගුණාත්මක විධික්‍රම ද අනුගමනය කර ඇත. අධ්‍යයනයේ එක් කොටසක් වශයෙන් ප්‍රදේශයේ භූමි තත්ත්ව දර්ශක සිතියම යාවත්කාලීන කරන ලද අතර ඒ ඇසුරින් ඉඩම් පරිහරණයේ සුවිශේෂ ලක්‍ෂණ විශ්ලේෂණය කර ඇත. අධ්‍යයනය මගින් අනාවරණය කෙරෙන ප්‍රධාන කරුණු කිහිපයකි. ප්‍රදේශයේ ගංවතුර හා නායයාම්වල තීව්‍රතාව හා විනාශකාරී බව වැඩිවීමට මිස ඒවායේ සංඛ්‍යාතය වර්ධනය වීමට ඍජු ලෙසම අවිධිමත් ඉඩම් පරිහරණය බලපා නැත. කළමණාකරණ මට්ටම අනුව ඉඩම් පරිහරණයේ විවිධත්වයක් දක්නට ලැබේ. ප්‍රශස්ත මට්ටමේ ඉඩම් පරිහරණයක් පවත්වා ගෙන යාමේ දී බාධාකාරී වී ඇති භෞතික සාධක පරයා මානව සාධක ප්‍රබල වෙමින් පවතී. ඒ සඳහා අනුගමනය කළ හැකි ප්‍රායෝගික ක්‍රමෝපායන් පිළිබඳව පර්යේෂණ පත්‍රිකාවේ පුළුල් ලෙස සාකච්ජා කර ඇත.

ප්‍රමුඛ පද: *ආපදා කළමණාකරණය, ගංවතුර, නායයාම්, අවිධිමත් ඉඩම් පරිහරණය*